PEOPLE'S LEASING
පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்
THE TRUSTED LEADER

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

(මහජන බැංකුවට අනුබද්ධිත සමාගමකි.)

2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

මෙම විගණන වාර්තාව විගණකාධිපතිවරයා විසින් විගණනය කොට ඉංග්‍රීසි බසින් නිකුත් කරන ලද විගණන වාර්තාවේ සිංහල අනුවාදයකි. ඉංග්‍රීසි වාර්තාව සහ ඕනෑම පරිවර්තන වාර්තාවක් අතර අහනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට ඉංග්‍රීසි වාර්තාව සැමවිටම බලපවත්වනු ඇත.

සභාපති
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තියට අනුව 2025 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී, සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2025 මාර්තු මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයන් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්, 2025 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. (සමාගම) සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි පරිපාලිත සමාගම්වල (සමූහය) මූල්‍ය ප්‍රකාශන විගණනය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මාගේ මෙහෙයවීම යටතේ සිදුකරන ලදී. මෙම විගණනය කර ගෙන යාම සඳහා, පොදු ව්‍යවහාරය තුළ ක්‍රියාත්මක වන වරලත් ගණකාධිකාරි ආයතනයක් මා වෙත සහය විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මාගේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

මගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2025 මාර්තු මස 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වසර සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූලික විගණන කරුණු

මූලික විගණන කරුණු වන්නේ පවත්නා කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය තුළ වඩාත් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමස්තයක් ලෙස සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ අන්තර්ගතය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර ඒ සම්බන්ධව මගේ විගණන මතය සකස් කිරීම තුළ මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් මම ලබා නොදෙමි. පහත සෑම කරුණක්ම මාගේ විගණනයේදී සැලකිල්ලට ගත් ආකාරය පිළිබඳ විස්තරය පහත වගුවෙහි දක්වා ඇත.

මූලික විගණන කරුණු	මූලික විගණන කරුණු මාගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය
ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මහිනු ලබන ණය හා ලැබිය යුතු කල්බදු සඳහා අපේක්ෂිත ණය අලාභ ප්‍රතිපාදන ණය සහ ලැබිය යුතු කල්බදු වල අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන, පිළිවෙලින් 25 සටහන් හි දක්වා ඇති පරිදි ක්‍රමක්ෂ පිරිවැයට මහිනු ලබන අතර, මූල්‍ය ප්‍රකාශනවල 25.6 සටහන් හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ. මෙය ප්‍රධාන විගණන කරුණක් වූ හේතු • කළමනාකරණ මැදිහත්වීමකින් සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයේ උපකල්පන සහ අනාගත මුදල් ප්‍රවාහයන් මට්ටම පිළිබඳ කළමනාකාරත්වයේ අපේක්ෂාව සමඟ සම්බන්ධ වේ. එවැනි ණය හා ලැබිය යුතු කල්බදු ආපසු අයකර ගැනීම සඳහා ප්‍රවාහයන්; සහ • අපේක්ෂිත ණය අලාභයන් වර්තමානයේ විවිධ ආර්ථික තත්වයන් යටතේ තක්සේරු කරන ලද ගාස්තු සහ මෙම එක් එක් අවස්ථා සඳහා තීරණය කරන ලද සම්භාවිතා පිළිබිඹු කරන වාර්තා ප්‍රමාණයන් ඇතුළත් කිරීම. ණය සහ ලැබිය යුතු කල්බදු සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල ප්‍රධාන ක්ෂේත්‍ර අතරට ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික ක්‍රියාදාම සහ ඒවාට අදාළ බර තැබීම් ඇතුළත් වේ. මේවා සහජයෙන්ම ඉහළ යන ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවයන්ට සහ මතභේදාත්මක විශ්ලේෂණයන්ට යටත් වේ. ප්‍රධාන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චය පිළිබඳ වැඩිදුර තොරතුරු 25.6 සටහන් වල අනාවරණය කර ඇත.	ක්‍රමක්ෂය කළ පිරිවැයක් යටතේ සිදු කරන ලද ණය සහ ලැබිය යුතු කල්බදු වල අපේක්ෂිත ණය අලාභ සඳහා වන ප්‍රතිපාදනවල ප්‍රමාණවත් භාවය ආමන්ත්‍රණය කිරීමේදී, මගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය. • මගේ වාර්තාවේ දිනය දක්වා පවතින හොඳම තොරතුරු මත පදනම්ව එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ වෙළඳපල ආර්ථික අස්ථාවරත්වයට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සහ පහත පවතින ක්‍රමවේදයන් සඳහා සමාගමේ විධිවිධාන පෙළගැස්වීම මම තක්සේරු කළෙමි. • මණ්ඩලය සහ කළමනාකාරත්වය විසින් අධීක්ෂණ මට්ටම, සමාලෝචනය සහ අපේක්ෂිත ණය අලාභ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අනුමත කිරීමේ මට්ටම තක්සේරු කිරීම ඇතුළත්, අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනයන් මම ඇගයීමට ලක් කළෙමි • මෙම සමාගමේ මූලාශ්‍ර ලේඛන හා ගිණුම් වාර්තා ඇතුලත් ලේඛන වලට අනුකූලව අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී භාවිතා වූ දත්තවල සම්පූර්ණත්වය නිරවද්‍යතාව හා වර්ගීකරණය පරීක්ෂා කලෙමි. • ණයවල තත්ත්වය පිළිබඳ තක්සේරු කිරීම හා අදාළ අදියර වර්ගීකරණවල සාධාරණත්වය තක්සේරු කරන ලදී. • ඉහත කරුණු වලට අමතරව, පහත ක්‍රියා පටිපාටියන් සිදු කරන ලදී: අපහායනය සඳහා ඒකභාවී පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු කල්බදු සඳහා: • අන්තර්ගත ඒකභාවී අපහායන ගණනය කිරීම්වල ගණිතමය හා සම්බන්ධ නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදී. • ආර්ථික තත්ත්වයන් සමඟ සිදු වූ අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම්වල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී. එවැනි ඇගයීම් සිදු කරන ලද්දේ, විශේෂයෙන් ඇපකරවල අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල තත්ත්වයට අදාළ මුදල් ප්‍රවාහ පුරෝකථනයන්හි වටිනාකම සහ කාල නිර්ණය සැලකිල්ලට ගනිමිනි. අපහායනය සඳහා සාමූහික පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු කල්බදු සඳහා: • අපේක්ෂිත ණය අලාභ අපහායනය සඳහා භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කරන ලදී. • කළමනාකරණය විසින් පාදක වූ ක්‍රමවේදය සහ කළමනාකරණ ආවරණ වලදී භාවිතා කරන විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල සාධාරණත්වය තක්සේරු කරන ලදී. අපගේ පරීක්ෂණයට භාවිතා කරන ලද උපකල්පිත අනාගත සිදුවීම් වල සාධාරණත්වය ඇගයීම, සලකා බලන ලද සාර්ව-ආර්ථික ක්‍රියාදාම සහ එක් එක් අවස්ථාවට පවරා ඇති සම්භාවිතා බර තැබීම ඇතුළත් විය. • මූල්‍ය ප්‍රකාශනවල 11 සහ 25 සටහන් හි දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන අනාවරණවල ප්‍රමාණතාව ඇගයීමට කරන ලදී.
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ තොරතුරු තාක්ෂණ මත පදම් වූ අභ්‍යන්තර පාලන සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ සැලකිය යුතු කොටසක් මූලික වශයෙන් ස්වයං ක්‍රියාවලිය හා අභ්‍යන්තර පාලනයන් සහිත බහු තොරතුරු තාක්ෂණ පද්ධති මත රඳා පවතී. තවද ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සම්පාදනය කරනු ලබන්නේ පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කරන ලද දත්ත හා වාර්තා භාවිතා කරමිනි. මේ අනුව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ තොරතුරු තාක්ෂණ පදනම් වූ අභ්‍යන්තර පාලනය ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.	වෙනත් කරුණු ඇතුළත් මගේ ක්‍රියපටිපාටිවලට පහත දෑ ඇතුළත්ය: • අදාළ සැලකිය යුතු ක්‍රියාවලින්ගේ අභ්‍යන්තර පරිසර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගත් අතර මූල්‍ය වාර්තාකරණය හා අදාළ හෙළිදරව් කිරීම් සම්බන්ධ පාලනයන් පරීක්ෂා කරන ලදී. • අභ්‍යන්තර විශේෂිත වත්කම් සහ; • සමූහයේ තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී • පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කළමණාකරණය සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ තොරතුරු තාක්ෂණ පද්ධතිවල සැලසුම් සහ මෙහෙයුම් ඵලදායිතාව හඳුනාගෙන, ඇගයීමට ලක් කර පරීක්ෂා කර ඇත. • සමූහයට අදාළ සයිබර් ආරක්ෂණ අවදානම් පිළිබඳ ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගැනීම සහ සයිබර් ආරක්ෂණ අවදානම් විසඳීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාවලින් සහ පාලනයන් සම්බන්ධව විමසීම් තුළින් මූලික වශයෙන් මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව. • පොදු ලෙජර සැසඳීම් විස්තරය සමාලෝචනය ඇතුළුව නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය සඳහා අනාවරණ උත්පාදනය කිරීමට භාවිතා කළ වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කරන ලදී.

1.4 සමාගමේ 2025 වාර්ෂික වාර්තාවට ඇතුළත් වෙනත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර නැති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට (අදාළ වන පරිදි) කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මම මෙම ආයතන සමූහයේ 2025 වර්ෂයේ වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණත්මක සාවද්‍ය ප්‍රකාශ සඳහන්වී ඇති බව මා නිගමනය කලහොත්, එම කරුණු නිවැරදිකර ගැනීම සම්බන්ධයෙන් මා ආයතනයේ පාලනාධිකාරිය සමඟ අදහස් හුවමාරු කරගත යුතුයි. තවදුරටත් නිවැරදි නොකළ ප්‍රමාණත්මක සාවද්‍ය ප්‍රකාශ තිබේනම්, ඒවා නියමිත වේලාවට ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථානෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- සමාගමේ හා සමූහයේ සවලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථානෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා අප වගකිව යුතුය. අපගේ විගණන මතය සඳහා අපි සම්පූර්ණයෙන්ම වගකියන්නෙමු.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (අෆ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෆ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (අෆ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෆ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අඳාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ.ක.ල)
ජී.එච්.ඩී ධර්මපාල
වැඩබලන විගණකාධිපති

2025 මාර්තු 31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා ප්‍රධාන මූල්‍ය දත්ත (විගණනය කල)

රුපියල් මිලියන වලින්	සමාගම		සමූහය	
	වර්තමාන කාල පරිච්ඡේදය	පසු ගිය කාල පරිච්ඡේදය	වර්තමාන කාල පරිච්ඡේදය	පසු ගිය කාල පරිච්ඡේදය
	2024 අප්‍රේල් 01 සිට 2025 මාර්තු 31	2023 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31	2024 අප්‍රේල් 01 සිට 2025 මාර්තු 31	2023 අප්‍රේල් 01 සිට 2024 මාර්තු 31
පොලී ආදායම	**26,088**	28,853	**29,526**	32,217
අඩු කලා ඃ පොලී වියදම්	**12,017**	17,201	**13,066**	18,267
ශුද්ධ පොලී ආදායම	**14,071**	11,652	**16,460**	13,950
වෙළඳ කටයුතු වලින් ලද ලාභය / (අලාභය)	**146**	136	**182**	124
වෙනත් මෙහෙයුම් ආදායම්	**2,194**	2,047	**6,209**	5,212
අඩු කලා ඃ මෙහෙයුම් වියදම් (ණය අපහායනය හැර)	**11,026**	9,616	**16,355**	14,211
අඩු කලා ඃ ණය අපහායනය	**(403)**	(1,156)	**(383)**	(1,354)
බදු පෙර ලාභය / (අලාභය)	**5,788**	5,375	**6,879**	6,429
අඩු කලා ඃ ආදායම් බදු	**2,185**	1,835	**2,789**	2,232
බදු පසු ලාභය / (අලාභය)	**3,603**	3,540	**4,090**	4,197

2025 මාර්තු 31 දිනට ප්‍රධාන මූල්‍ය දත්ත (විගණනය කල)

රුපියල් මිලියන වලින්	සමාගම		සමූහය	
	2025 මාර්තු 31 දිනට	2024 මාර්තු 31 දිනට	2025 මාර්තු 31 දිනට	2024 මාර්තු 31 දිනට
වත්කම්				
මුදල් හා බැංකු ශේෂයන්	**21,729**	24,016	**25,277**	28,199
රජයේ සුරැකුම්පත්	**5,161**	18,372	**10,016**	22,363
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු	**1,574**	1,390	**-**	-
ණය (සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ණය හැර)	**155,518**	102,260	**170,452**	116,920
කොටස් සඳහා ආයෝජන	**4,423**	3,971	**649**	627
දේපල ආයෝජන	**302**	295	**1,375**	1,306
දේපල පිරියත සහ උපකරණ	**3,660**	2,722	**5,835**	5,067
වෙනත් වත්කම්	**2,164**	6,826	**6,978**	10,776
මුළු වත්කම්	**194,531**	159,852	**220,582**	185,258
වගකීම්				
බැංකු සඳහා ගෙවිය යුතු	**11,437**	2,263	**16,829**	7,181
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු	**-**	-	**-**	-
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	**124,530**	97,438	**130,069**	103,843
වෙනත් ණය ගැනීම්	**5,015**	11,032	**5,015**	11,032
වෙනත් වගකීම්	**11,137**	7,293	**18,644**	14,056
මුළු වගකීම්	**152,119**	118,026	**170,557**	136,112
ස්කන්ධය				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**19,230**	19,230	**19,230**	19,230
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	**3,148**	2,968	**3,326**	3,108
රඳවාගත් ඉපැයුම්	**19,977**	19,885	**24,431**	23,976
අනෙකුත් සංචිත	**57**	(257)	**633**	432
සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි මුළු ස්කන්ධය	**42,412**	41,826	**47,620**	46,746
පාලනය කල නොහැකි හිමිකම	**-**	-	**2,405**	2,400
මුළු ස්කන්ධය	**42,412**	41,826	**50,025**	49,146
සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	**19.69**	19.41	**22.10**